# ගොවි අදහස්

**වේරගොල්ලේ ලලී.**

පැ : අද රටේ සිවුරු පොරවා ගෙන නිකරුනේ කාලය ගත කරන හාමුදුරුවරු ලක්ෂ ගණනක් සිටිති. ඒ අයගේ කැමැත්ත ඇත්නම් රටත් ජාතියත්, බොදු දහමත් දියුණු කිරීම සඳහා සීමා සහිත කාලයක් සිවුර ගලවා දමා ගොවිතැනට බැස්සොත් නරකද? එය බෞද්ධ ශාසනයට අපහාසයක් කියා මානම් සිතන්නේ නෑ.

උ. ඔබේ පැනය භෞතිකවාදී විවරණයකි. තවද, ලංකාවේ ඇත්තේ හීනයාන බුද්ධාගමයි. ජපන් රට වැනි මහායාන බුද්ධාගම ඇති රටවල නම් මෙවැනි අදහසකට පිකක්වත් ඉඩ ලැබේ. අධ්‍යාත්මික ගුණවගාවක් පිණිස සිල් රැක තණ්හාව දුරුකොට නිවන් දැකීමට ප්‍රාර්ථනා කරන ශ්‍රමනයන් වහන්සේලාට ආර්ථික ප්‍රතිලාභයන්ට වඩා අවශ්‍යව ඇත්තේ රටත් ජාතියත් නිසිමඟ යැවීමට හොඳ පුරවැසියන් බිහිකොට මනා සමාජසීය පරිසරයක් බිහිකිරීම විනා කුඹුරට බැස ගොයම් මැස්සන් මැරීම හා වෙල් කක්කුට්ටන්ට උගුල් ඇටවීම නොවේ.—කතෘ.

වේරගොල්ලේ ප්‍රැන්සිස් :—

පැ : සතුන් ඇතිකිරීම හා මස් අනුභව කිරීම පාපයක් බැව් බෞද්ධ ධර්මය උගන්වනවා. එහෙත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගොවිතැන හා සත්වපාලනය දියුණු කිරීමට උපදෙස් දෙයි. ඉතින් අප එකඟවිය යුත්තේ මෙයින් කවර අදහසටද?

උ : බුදු දහමේ එසේ දේශනා කොට නැත. බොහෝ බෞද්ධ නිවෙස්වල බල්ලන් හා බලලුන් ඇතිකරයි. කිරි ලබාගැනීමට කිරි දෙනුන් ඇතිකරන ස්ථානද එමටය. ජීවයක් නොමැති, බෞද්ධ, බිත්තර නිෂ්පාදනය කරන බොහෝ බොදු නිවෙස් ඇත. බුදු දහමේ දේශනාකොට ඇත්තේ බලුමස්, අශ්වමස්, කොටිමස් වඳුරුමස් වැනි කැත කුණු අනුභව නොකිරීමටයි. බුදු රජාණන් වහන්සේ පවා පිරිනිවන් පෑමට පෙර සූකර මස් වැලඳූ බැව් අප අමතක කළයුතු නොවේ. යම්කිසි වැඩකින් ලැබෙන පලවිපාක විනා දඬි නීති බෞද්ධ දහමේ පණවා නැත. එබැවින් කවුරු මොන උපදෙස් දුන්නත්, ඔබේ හෘද සාක්ෂියට අනුව සමාජයට ගැලපෙන කටයුත්තේ නියැලෙන්නට හෝ තමන්ට කැමති පරිදි ආගම ඇදහීමටද නිදහස තිබේ. තවද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ආගමික ආයතනයක් නොවන බැව් පෙන්වා දීමට කැමැත්තෙමි. කතෘ.

බලංගොඩ කරුණාරත්න :—

පැ : 1. කුඹුරු වල්පැල මර්දනයට ඉසින රසායනික බෙහෙත් ද්‍රව්‍ය හේන්වල වල්පැල මර්දනයට නුසුදුසුද?

2. මේ ද්‍රව්‍යයන් හේන්වල ගොයමට හානිකරයිද?

3. එසේනම් ගොවීහු මෙම ඒවා මේ වගාවල වල් මර්දනයට නොගන්නේ ඇයි?

4. අපේ ගමේ ගොවීහු කෘත්‍රිම ගොවිතැන් ක්‍රමවලට උනන්දුවක් නොකරයි.

5. එය ඔවුනට වටහාදීමට ගතයුතු පියවර කුමක් ද ?

6. ගොවිකම් සඟරාවේ බීජ ඇතිකරගන්නා ක්‍රම ගැන කථා තිරයක් දැම්මොත් හොඳයි.

උ: 1. නැත.

2. නැත.

3. ගොඩ වී ගොවිතැනින් ආදායම අඩු නිසා.

4. මෙවැනි ගොවිතැන් ක්‍රමයක් නැත. ඇත්තේ නවීන ගොවිතැන් ක්‍රමයි.

5. කෘත්‍රිම ගොවිතැන් ක්‍රම වටහා දීම අවශ්‍ය නොවේ. පලාතේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරිගේ කෘෂිකර්ම ව්‍යාප්ති සේවක හමුවන්න.

6. මෙවැනි ලිපි මීට කලින් පලකොට ඇත.—කතෘ.

බලංගොඩ කරුණාරත්න :—

පැ: කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් උසිගන්වන ගොවීහු මහත්සියෙන් වවන ලද වගා ඌරන්, හාවුන්, ගෝනුන්, මුවන්, ඉත්තෑවන්, ආදී සතුන් විනාශකරත්. එහෙත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කියන්නේ සාත්තුව පමණයි. සාත්තුවේ ප්‍රධාන තැනක් ගන්නා මේ ගැන කිසිම දෙයක් නොකියයි. එමනිසා මේවා වැලැක්වීමට ඇති උපක්‍රම මොනවාද ?

උ: ගොවියන් උසිගැන්වීම දුෂ්කර කාරියකි. ගොවීන්ට මොලය ඇති ඥානවන්ත පිරිසක් බැවිනි. පලාතේ දිසාපති, ආදායම්පාලක නිලධාරි හා ග්‍රාමසේවක යන මහතුන්ගෙන් විමසන්න. ඒ අතරම සත්වයන් හා වෘක්ෂලතා ආරක්‍ෂා පනත ගැනත් තරයේ සිහි තබාගන්න.

පැ: ලංකාවේ ආහාර හිඟය ඇතිවීමට හේතුවූයේ කුමක් ද ?

උ: 1. නිෂ්පාදනයට වඩා පාරිභෝගය වැඩිවීම නිසා.

2. විදේශ බලපෑම.

පැ: රටක ජනගහනය වැඩිවීමට හේතුව කුමක් ද ?

උ: (අ) මැරෙන ප්‍රමාණය අඩුවීම හා ඉපදෙන ප්‍රමාණය වැඩිවීම.

(ආ) අඩුවයසින් විවාහවීම.

(ඇ) සෞඛ්‍ය සේවය දියුණුවීම නිසා ගැබිනි මව්වරුන් වැඩිකල් ජීවත්වීම, හා මරණයට ගොදුරුවන අය අඩුවීම. වසංගත ලෙඩ රෝග අඩුවීම.

(ඈ) නවීන විද්‍යාවේ බලපෑම.

(ඉ) උත්පත්ති පාලනයක් නොමැතිකම.

(ඊ) මිනිසුන්ට ප්‍රීතිවීමට, කාලය ගත කිරීමට, තමන් සිත් යොමුකිරීමට වෙනත් විනෝද ක්‍රීඩා, එළිමහන් රංගපීඨ, කලා කෞශල්‍යය පෙන්වීමට ඉඩ ප්‍රස්ථා නොමැතිකම නිසා ලිංගික ආස්වාදයන් පමණක් ලබා ගැනීමට ඇති බලවත් ඉල්ලුම.

(උ) දරිද්‍රතාවය.

(ඔ) යුද්ධ ඇති නොවීම ආදිය—කතෘ.

පැ: හුනු යෙදීමෙන් පස සාරවත් කල හැකිද?

උ: ඇඹුල් ගතියෙන් යුත් තෙත් කලාපයේ පසට අවුරුදු 4-5 කට වරක් හුනු යෙදීමෙන් පස සාරවත් වෙයි. හුණු යෙදිය යුතුද නැද්ද යනු පලාතේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් විමසන්න.

පැ: අපේ සිංහල ජනයා ගොවිතැනට කම්මැලි වූයේ ඇයි?

උ: සිංහල ජනයා ගොවිතැනට කම්මැලි නැත. තේ, රබර්, පොල් වැවීමද ගොවිතැනකි. සිංහල ජනයා එයට කම්මැලි නැ නේද? ඒ තේ, පොල්, රබර්, වලින් හොඳ ආදායම් ලැබෙන බැවිනි. විදේශිකයෝ අනික් ගොවිතැන්වලින් ආදායම් නොලැබෙන තැනට ඔවුන් රජකල ශතවර්ෂ හතරේදී වැඩ සැලැස්සුවෝය. එබැවින් ආදායම් ලබාගැනීමට බැරි ගොවිතැන් කිරීමට සිංහලයෝ අකමැති වූහ. අනික් කරුණ නම් ගොවිතැන සරුලෙස කලහැකි වියලි කලාපයේ මැලේරියා වැනි වසංගත රෝග බෝවීම වැලක්වීමට හා නටබුන් වන වැව් ප්‍රතිසංස්කරණයට විදේශ ආධිපත්‍යයෙන් අනුබලයක් නොලැබීමයි. නියම ඉඩ ප්‍රස්ථා දුනහොත් ලංකාවේ ගොවියන්ට ලෝකයේ ඕනෑම රටක ගොවියන් අභිබවා සිටිය හැක. ඇත්තේ කම්මැලිකම නොවේ. ඉඩ ප්‍රස්ථා නොමැතිකමයි. එය නැතිකිරීමට දැන් ඇති රජය කටයුතු කරගෙන යයි.—කතීෘ.

ඇතිලිගම කරුණාරත්න:—

ප්‍ර: බීජ අර්තාපල් නිපදවා ගැනීම සඳහා ගොවියෙකු අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙල කුමක්ද?

උ: ගොවියන් බීජ අර්තාපල් නිපදවිය යුතු නොවේ. එය මහත් දුෂ්කර කාරියකි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය ගොවියන්ට බීජ අර්තාපල් සපයනු ලැබේ.

1. අනුරාධපුරයේ කරුණාරත්න:—

ප්‍ර: එක් එක් සමාගම මගින් නිපදවන කෘෂි. රසායනික බෙහෙත් ද්‍රව්‍ය වෙළඳ පොලට යවන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අනුමත කිරීමෙන් පසුවද?

උ: සෑම බෙහෙතක්ම අනුමත නොකෙරේ. අනුමත කරන ලද බෙහෙත් දෙපාර්තමේන්තු පත්‍රිකාවල සඳහන්වේ.

2. පැ: එසේ අනුමත කිරීමක් නොමැතිනම් සමාගම් මගින් නිකුත් කරන සෑම බෙහෙත් වද්‍යයක්ම හොඳයයි පිළිගත හැකිද?

උ. නුපුළුවන.—කතීෘ.

* * *